**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

**විෂය - පෙරදිග සංගීතය**

**සතිය - 05**

**13 ශ්‍රේණිය**

**Prepared by Mrs.H.A.U.W.ධර්මදාස**
**රත්නපුර අධ්‍යාපන කලාප**

**නිපුණතාවය 4.0 / නිපුණතා මට්ටම 4.1** **I කොටස** **පාඩම : ඛ්‍යාල් ගායන ශෛලිය**

**ප්‍රශ්න අංක 01 සිට 5 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01. ඛ්‍යාල් ඝරාණාවක් නොවන්නේ ,
1. මෙවාති 2. පටියාලා 3. ධගුර් 4. කිරාණා 5. ග්වාලියර්

02.ඛ්‍යාල් ගායන ශෛලියේදී භාවිතා නොවන තාල පදයකි ,
1. ඒක්තාල් 2. ජප්තාල් 3. තිලවඩා 4. දාදරා 5. ධමාර්

03.ඛ්‍යාල් ගායන ශෛලියේදී ශ්‍රැතිය පවත්වාගැනීම සඳහා යෝග්‍යම සංගීත භාණ්ඩය,
1.සර්පිනා 2. සාරංගි 3. තාම්පුරා 4. සන්තූර් 5. රුද්‍ර වීණා

04. කලා රාම්නාත්, සංජීව් අභ්‍යාන්කර් ආදී සුප්‍රසිද්ධ ශිෂ්‍යයන් භාරතීය සංගීතයට දායාද කල අද්විතීය මහා සංගීතවේදියා වනුයේ,
1.පණ්ඩිත් ජස්රාජ් 2.උස්තාද් අමීර් ඛාන් 3.උස්තාද් රෂීඩ් ඛාන්
4.පණ්ඩිත් භිම්සෙන් ජෝෂි 5.පණ්ඩිත් ඕම්කර්නාථ් ඨාකූර්

05. ඛ්‍යාල් ගායන ශෛලිය හින්දුස්තානි සංගීතයට දායාද වූයේ,
1. මෝගල් යුගයේදී 2. වෛදික යුගයේදී 3. හින්දු යුගයේදී
4. බ්‍රිතාන්‍ය යුගයේදී 5. නූතන යුගයේදී

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හිස්තැන් වලට සුදුසු පිළිතුර යොදන්න.**

06. බඩා ඛ්‍යාල් හා ........................................ වශයෙන් ඛ්‍යාල් ප්‍රභේද දෙකකි.

07. ................................ ඛ්‍යාල් ගායන ශෛලියේදී ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදාගනී

08. …………………………………… නම් ඛ්‍යාල් ගායන ශිල්පිනිය **ශාස්ත්‍රීය සංගීතයේ රැජින** නම් විරුදාවලිය ලබා ඇත.

09. ඛ්‍යාල් ගීත ………………….. ගීත ආකෘතියට අනුව නිර්මාණය වී ඇත.

10.මෝගල් යුගයේ විසූ සදාරංග හා …………………… යන සංගීත ශිල්පීන් දෙදෙනා ඛ්‍යාල් ව්‍යාප්තිය සඳහා මහත් දායකත්වයක් ලබා දී ඇති බව සඳහන් ය.

**නිපුණතාවය 4.0 / නිපුණතා මට්ටම 4.1** **I කොටස** **පාඩම : ඛ්‍යාල් ගායන ශෛලිය**

**සියලුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**

01. ඛ්‍යාල් ගායන ශෛලිය පිලිබඳ පහත කරුණු ඔස්සේ පහදන්න
- නිර්මාතෘවරයා
- ප්‍රභේද
- භාවිත සංගීත භාණ්ඩ
- ආකෘතිය
- ආලාප හා තාන් භාවිතය
- ඛ්‍යාල් රචිත භාෂා
- භාවිත තාල පද
- ගායක ගායිකාවෝන්ද
- ඛ්‍යාල් ගුරුකුල වෙහෙත් ඝරාණා
- රාග භාවිතය